බේරා ගැනීමටය.

වන්නියේ දේශපාලන බලය ඊ.පී.ඩී.පී. ය වෙත යද්දී කරුණා පිල විසින් මඩකලපුව නගරයේ තම දේශපාලන කාර්යාලයක් විවෘත කළේය. ඒ මාර්තු පළවනදාය.

කරුණා ප්‍රභා විරසකයෙන් පසුව කරුණා පිල විසින් උතුරු නැගෙනහිර දේශපාලන කාර්යාලයක් විවෘත කළ පළමු අවස්ථාවද මෙය වේ. කරුනා පිලේ දේශපාලන කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා මහජන සම්බන්ධතා කාර්යාලය නමින් මෙම කාර්යාලය විවෘත කර තිබුණි.

මඩකලපුවේ තම බලය පෙන්වූ කරුණා පිල ඉකුත් හතර වනදා අලුයම මඩකලපුව වව්නියාව හි වන්නි කොටි අනුකණ්ඩයකට පහර දුන්නේය. එහිදී වන්නි කොටියකු මියගිය අතර එම ප්‍රහාරයද රජයේ හමුදාවන් මත පැටවීමට කොටි සංවිධානය පියවර ගත්තේය.

මෙවැනි සිද්ධීන් හරහා සාම සාකච්ඡා පැවැත්වීමට අවිනිශ්චිත විය හැකි බවද කොටි දේශපාලන නායක තමිල් සෙල්වම් අනතුරු ඇඟෙව්වේය.

තත්ත්වය මෙසේ තිබියදී රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් තම දිවි පරදුවට තබමින් විශාල කාර්යය භාරයක් කළ ජ්‍යේෂ්ඨතම හමුදා නිලධාරියකු වන මේජර් ජනරාල් වජිර විජේගුණවර්ධන මහතාව විශ්‍රාම ගැන්වීමට ආරක්ෂක අමාත්‍යාංශය උත්සාහ ගන්නා බව මෙම සතියේ හෙළිවිය.

කරුණාඅම්මාන් කොටි සංවිධානයෙන් වෙන්වන අවස්ථාවෙන් මඩකලපුව - පොලොන්නරුව 23 වන සේනාංකාධිපති වශයෙන් සිටි වජිර විජේගුණවර්ධන මහතා කරුණා අම්මාන්ට වනින්යේ සිර අඩස්සියට ගැනීමට කොටි නායක ප්‍රභාකරන් සූදානම් වූ මොහොතේ එය වළක්වාලමින් රටේ ආරක්ෂාව වෙනුවෙන් කළ කාර්යය භාරය අති මහත්ය.

එදා එම නිලධාරියා ගත් තීරණය නිසා කරුණා අම්මාන් වන්නි කොටි සංවිධානයෙන් වෙන්ව ගියේය. කරුණා අම්මාන් ආරක්ෂාව පතා වජිර විජේගුණවර්ධන මහතා හමුවීමට පැමිණි අවස්ථාවේ ආරක්ෂා සහිතව කොළඹට යැවීමට පියවර ගත් බවට කොටි සංවිධානයද හොඳින් දනී.

එයින් පසුව රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් විශාල කාර්යය භාරයක් කරමින් වන්නි කොටින්ට නැගෙනහිර බලය පෙන්වීමට ඉඩක් නොදුන් එකම නිලධාරියාද වූයේ වජිර විජේගුණවර්ධන මහතාය.

මේ නිසාම වැලිකන්දේදී වජිර විජේගුණවර්ධන මහතාව ඝාතනය කිරීමට කොටි සංවිධානය අවස්ථා කිහිපයකම උත්සාහ කළද එම උත්සාහයන් ව්‍යාර්ථ විය. අනතුරුව කොළඹ මෙහෙයුම් ආඥාපති වශයෙන් පත් කෙරුණු විජේගුණවර්ධන මහතාව එම තනතුරේ සතියක්වත් වැඩ කිරීමට ඉහල ප්‍රධානීන් ඉඩ දුන්නේ නැත.

කොළඹ කොටි ක්‍රියාකාරකම් සහමුලින්ම මැඩ පවත්වා ආරක්ෂාව තර කිරීමට අත්‍යවශ්‍යය බව පෙන්වා දෙමින් කොළඹ ආරක්ෂාව සඳහා වාර්තාවක් සකස් කිරීම හේතුවෙන් මෙම නිලධාරියා ආඥාපති තනතුරින් ඉවත් කෙරුණි.

එවකට පැවති චන්ද්‍රිකා රජය වැඩ කරන නිලධාරීන්ට සැලකුවේ ඒ ආකාරටය. එතැනින් පනාගොඩ 11 වන සේනාංකයට පත්ව ගිය විජේගුණවර්ධන මහතා ඉලක්ක කරමින් කොටි බෝම්බකරුවන් කොළඹට පැමිණි බවද බුද්ධි අංශ අනතුරු ඇඟවීය. මෙම සියළු තර්ජන වලට ලක්ව තිබියදී ලබන අප්‍රේල් 4 වන දාට වයස අවුරුදු 55 පිරෙන බව පවසා ඒ මහතාව විශ්‍රාම ගැන්වීමට යුධ හමුදාපතිවරයාද ආරක්ෂක අමාත්‍යාංශයට නිර්දේශයක් යවා ඇත.

මීට පෙරදී මේජර් ජෙනරාල්වරුන්ට මේජර් ජනරාල් ධූරයේ වසර 3 ක කාලයක් කටයුතු කිරීමට ඉඩ සැලසුනද විජය ගුණවර්ධන මහතාට විශ්‍රාම ගැනීමට සිදුව ඇත්තේ වසර එකහමාරක්වත් සිය තනතුරේ සිටීමට අවස්ථාවක් නොමැතිවයි.

රටේ ආරක්ෂාව වෙනුවෙන් අත්‍යවශ්‍යය නිලධාරීන් තවදුරටත් සේවයේ තබා ගැනීමට ජනාධිපතිවරයාට ඇති බලතල මෙවර ප්‍රයෝජනයට නොගතහොත් තවත් දක්ෂ නිලධාරියෙකු රටට අහිමිවනු නියතය. රජයේ නිලධාරීන්ට මෙම නිලධාරියාගේ අවශ්‍යතාවය නොපෙනුනත් වන්නි කොටින්ට සහාය දක්වන දෙමළ පුවත්පත්වල සඳහන් වූ ආකාරයට කොටින්ට ඇති එකම අභියෝගය මෙම නිලධාරියායි.

කරුණා අම්මාන් යනු ජෙනරාල් වජිර විජේගුණවර්ධන මිස වෙන අයකු නොවන බව දෙමළ පුවත්පත් තරයේ කියා සිටියේ මේ නිසාය.

ජිනිවා සාකච්ඡා ඇරඹීමෙන් පසුව රජයට එල්ල වූ ප්‍රධානම අභියෝගය වන කරුණාපිල නිරායුධ කිරීමේ අභියෝගය යටපත් කිරීම සඳහා මෙම නිලධාරියාව විශ්‍රාම ගන්වන්නේ ද යන සැකය ආරක්ෂක අංශ තුළ කථාබහට ලක්ව ඇත.

දැනට කොටින්ගේ ප්‍රබලම ඉලක්කයක් වී ඇති මෙම දක්ෂ නිලධාරියා විශ්‍රාම ගැන්වුවහොත් ඔහුගේ පවුලේ සාමාජිකයන් පවා විදේශ රටවලට යැවීමට සිදුවනු ඇත. ආරක්ෂාව පතා ඔවුන්ව විදේශ රටකට යැවීමට රජයේ පාර්ශවයෙන් පියවර නොගතහොත් ඔවුන්ද කොටින්ගේ ඉලක්ක වනු නොඅනුමානය.

මෙතෙක් රට වෙනුවෙන් වැඩ කළ බුද්ධි නිලධාරීන්ට සිදුවූ ඉරණම අත්වීමට ඉඩනොදී මෙවැනි ජාතික වීරයන් රැක ගැනීම ජාති හිතෛෂී කාගේත් වගකීම වනු ඇත. ■




**කැළණි පාලම** නාට්‍යය වේදිකා ගත කිරීම සඳහා මෙල්බන් පුරවරයෙන් ඉල්ලීමක් ලැබෙන්නට පාදක වූ කාරණා මොනවා ද?

2004 ජූලි මාසයේ මෙල්බන් හිදී ආර් ආර් සමරකොන් ගේ දූවිලි නාට්‍යය වේදිකා ගත වුවා. එය අති සාර්ථක වුණා. ඒ නිසා ම කැළණි පාලම නාට්‍යය සඳහා ඉල්ලුමක් ලැබුණ බව විශ්වාස කරනවා.

**කැළණි පාලම නාට්‍යයේ ඉතිහාසය ගැන යමක් කීවොත්..**

මෙය ප්‍රථම වරට වේදිකා ගත වූයේ 1978 වසරේ. ඒ අවදිය වන විට සමරකෝන්ගේ නාට්‍ය ජනතාව ආදරයෙන් වැළඳගෙන තිබුණා. මේ කාලය සිංහල නාට්‍ය ඉතිහාසයේ ස්වර්ණමය යුගය. මහාචාර්ය සරච්චන්ද්‍ර, හෙන්රි ජයසේන, සුගතපාල ද සිල්වා, දයානන්ද ගුණවර්ධන වැනි විශිෂ්ඨ නාට්‍යකරුවන්ගේ නිර්මාණ නිසා සංහල නාට්‍ය කලාවේ පුනරුදයක් ඇති වී තිබුණා. උසස් නාට්‍ය බොහෝ ගණනාවක් බිහිවුණ අතර ඒවා නරඹන විචක්ෂණ බුද්ධියෙන් හා රසාස්වාදනයෙන් යුතු නරඹන්නන් සිටියා.

**ඒ සමයේ වැඩි ජනප්‍රියත්වයක් ලැබුවේ පරිවර්තන නාට්‍ය නොවේ ද?**

ඔව්.. එහෙම තත්වයක් තිබුණා. ඒවා උසස් නාට්‍ය. ඒත් සමරකෝන් ගේ ඉඩම සහ අහසින් වැටුණු මිනිස්සු බිහිවුණේ ඒ අතර. ඒවා අතිශමය ජනප්‍රිය වුණා.

**ප්‍රේක්ෂක හද බැඳගැනීමට සමරකෝන් ගේ නාට්‍ය වල තිබූ විශේෂත්වයන් මොනවාද?**

මේ නාට්‍ය කීති ස්වතන්ත්‍ර යි. සමාජයේ ගැටළු සහ දුබලතා සංවාදශීලී නාට්‍ය විලාසයෙන් ඉදිරිපත් කළා. මේ සංවාද සරලයි. හාස්‍ය රසය පිරී තිබුණා. හද සසල කරන ගැටලු පිලිබඳව සාකච්ඡා වුණා. මේ කෘති සියළු නාට්‍ය රසයෙන් අනූන වුණා කියලා කියන්න ඇහැකි.

**සංගීතය නැති, දෙපිට කැපෙන, හිනා උපදවන දෙබස් කී පමණින් නාට්‍යයක් උසස් වෙන්නේ නෑ නේද?**

ඇත්තටම නැහැ.. සමරකෝන්ගේ නාට්‍ය නිකම්ම නිකං දෙපිට කැපෙන වචන ගොඩක් නොවේ. සාරවත් භාෂා විලාසයකින් අලංකාරවුණ කාව්‍යමය ගුණය සපිරි දෙබස්. ඒ දේවල් ඉතා නාට්‍යෝචිත ලෙස යොදා ගැනීමට දක්ෂ නාට්‍ය කරුවෙකුට හැකියි. ඒ ශක්තිමත් බව නිසා සංගීතය අවශ්‍යතාවයක් පැන නගින්නේ නැහැ. නාට්‍ය රසය නිරායාසයෙන් ම උපදිනවා.

**කැළණි පාලම නාට්‍යයේ අන්තර්ගතය?**

කැළණි පාලම යට පැල්පත් අටවාගෙන කීර වගා කරලා ජීවත්වන උප සංස්කෘතියක් අපේ සමාජයේ තිබෙනවාත වැහි වැහැලා ගඟ උතුරනකොට පාලම උඩ තාවකාලික වහලක් අටවා ගන්නවා. එයාලත් කනවා බොනවා. පාසල් යනවා. ප්‍රේම කරනවා. කසාද බඳිනවා. මළ ගෙදරකට හිස් අතින් යන්නෙ නෑ. අඩු තරමේ තමන්ට කන්න තියෙන පාන් ගෙඩියවත් ඔතාගෙන යන්නට තරම් හිද හොඳයි. ඒ වගේම කූට දේශපාලකයන්ගේ රැවටිලි වලට බඳුන්වෙනවාත කැළණි පාලම නාට්‍යය පුරාම මේ වාගෙ ජීවන බරක් ජීවන සුවඳක් එකමුසුවුණ සජීවී චරිත රාශියක් තියෙනවා. ඒවායේ නිරූපනයන් උසස් තත්වයක තිබුණ බවට විවාදයක් නැහැ.

**මේ නාට්‍යය මුලින්ම වේදිකා ගත වී දැනට වසර 28ක් ගත වෙලා. මෙහි සාකච්ඡාවට බඳුන් වූ කරුණු කාරණා අදට අදාල වෙනවද?**

ඕස්ට්‍රේලියාවේ ඉඳලා ගිහිල්ලා කටුනායක ගුවන් තොටුපළින් බැහැලා කොළඹට යනකොට ඔබලාට මේ තත්වය ඇස් දෙකෙන්ම දැකගන්න පුලුවන් වේවි.

> මේ කාලය සිංහල නාට්‍ය ඉතිහාසයේ ස්වර්ණමය යුගය. මහාචාර්ය සරච්චන්ද්‍ර, හෙන්රි ජයසේන, සුගතපාල ද සිල්වා, දයානන්ද ගුණවර්ධන වැනි විශිෂ්ඨ නාට්‍යකරුවන්ගේ

**කැළණි පාලම ඔය තරම් උසස් නම් සමරකෝන් ගෙ අනිත් නාට්‍ය වලට වගේ සම්මාන නොලැබුනේ ඇයි?**

ඒ වන විට සමරකෝන්ගෙ නාට්‍ය රාජ්‍ය නාට්‍ය තරග වලින් වැඩිම සම්මාන ලැබා තිබුණා. පිබිදෙන නාට්‍ය ශිල්පී පරපුරකට අවස්ථාවක් දීමේ අරමුණෙන් සමරකෝන් තම කැළණි පාලම නාට්‍යය සම්මාන උළෙලට ඉදිරිපත් කළේ නැහැ. ඒ අවදියේ නාට්‍ය කලාව දියුණුවෙන් දියුණුවට පත් වුණේ ඒ වාගේ ආත්මාර්ථයෙන් තොර නාට්‍ය කාලවට සැබෑ ආරයෙන් සහ ඇප කැපවීමෙන් කටයුතු කළ නාට්‍යවේදීන් සිටි නිසා. ඒත් මහජන සහ විචාරක සම්මාන අසම සමව ලැබූ ස්වතන්ත්‍ර වේදිකා නාට්‍යයක් ලෙස කැළණි පාලම හඳුන්වා දෙන්න පුළුවන්.

**කැළණි පාලම නාට්‍යය එදා ලැබූ ජනප්‍රියත්වය අදත් තිබෙනවාද?**

එදා අපි මාසේ දවස් තිහෙන් විසිපහක්ම දිවයින පුරා දර්ශණ වාර පැවැත්තුවා. අදත් ප්‍රේක්ෂක ආකර්ශණය ගැන විවාදයක් නැහැ. මෙල්බන් නුවරින් ආරාධනා ලැබුනෙත් ඒ නිසා නේ.


## VCE EXCELENCE 2006

Individual Tuition programmes

- Modern Coaching Techniques- Develop your child's potential beyond school curriculum level.
- Individually tailored study programmes that will compliment school study programme- Guaranteed excellent results.
- Confidence building and help on Time Management & Motivation are an integral part of our study programmes.
- Printed Notes, Practice Exams, regular revision

Professionally qualified experienced tutors who have helped many VCE students to achieve success and excellent results over many years!

Individual Tuition – North and North Western and other Melbourne suburbs

**VCE Year 11& 12 – 2006/2007 exams**
**Information Processing & Management (IPM)**
**Information Systems (IS)**
**Physics - Call Wasantha - 9337 1043**

**Year 6 to VCE – Maths**
**Maths & IT programmes for secondary students**
**VCE Specialist Maths,**
**VCE Mathematical Methods &**
**VCE General Maths - Call Susil – 9311 1763**

Experience, Expertise & commitment of our team can make the difference!
VCE Excellence 2006 study programmes are proudly presented by
Victorian Centre for Education Excellence &
Western Metropolitan College of Mathematics.
Programme Coordinators:
Wasantha Perera, BSc Eng Hons, MEng, MBA Tel – 9337 1043
Susil Ratnasekara , ASA, BSc, MSc Tel 93111763, 0411569811

Email – info@vce.com.au or
wperera@netspace.net.au
susil@optusnet.com.au

**1 +1 >2 It is Synergy!**

WE STRONGLY BELIVE IN THE EXCELLENCE OF EDUCATION


